# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**

**2017 අප්‍රේල් - ජූනි**

**සමාජීයවිද්‍යා පීඨය**

**ආර්ථික විද්‍යාව - ECON – E 2015**

**සූක්ෂම ආර්ථික විද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i. ආර්ථික විද්‍යාව විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයක් වශයෙන් සැලකිය හැකි දැයි හේතු දක්වමින් විමසන්න. (ලකුණු 08)

ii. සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව යනුවෙන් මානව හැසිරීම් විග්‍රහ කිරීම සඳහා ආර්ථික න්‍යාය මූලික කොටස් දෙකකට බෙදා වෙන් කරන විද්‍යාත්මක පදනම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 12)

02. i. ආන්තික උපයෝගිතා න්‍යායේදී භාවිත උපකල්පන සහ ඒවායේ අදාළත්වය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 10)

ii. හීනවන ආන්තික උපයෝගිතා සිද්ධාන්තය රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. i. උපේක්ෂා වක්‍රය අර්ථ දක්වා, උපේක්ෂා වක්‍රවල ගති ලක්ෂණ රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. පාරිභෝජක සමතුලිතය තීරණය වන ආකාරය උපේක්ෂා වක්‍ර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

04. i. විචල්‍ය සාධක අනුපාත නියමය පැහැදිලි කර එම නියමයට අනුරූපව කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයේ හැසිරීම රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 12)

ii. ඉහත රූප සටහන භාවිතයෙන් කෙටි කාලීන නිෂ්පාදන අවධි බෙදා දක්වන්න. (ලකුණු 08)

05. i. පරිමාණුකූල ඵල පිළිබඳ නීති විස්තර කර සමනිෂ්පාදිත වක්‍ර සිතියම් භාවිතයෙන් එම නීති පැහැදිලි කරන්න. (ලකුණු 12)

ii. දිගු කාලීන හා කෙටි කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍ර අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 08)

06. i. පූර්ණ තරඟ වෙළෙඳපොල තත්ත්වයට අදාළ උපකල්පන පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. පූර්ණ තරඟකාරී ආයතනයකට දිගු කාලයේදී අති ප්‍රාමාණික ලාභ ලැබිය නොහැක්කේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. එක් එක් වෙළෙඳපොල තත්ත්වයට අදාළ උපකල්පන පදනම් කර ගනිමින් පූර්ණ තරඟකාරී, ඒකාධිකාරී හා ඒකාධිකාරීතරඟ වෙළෙඳපොල ආකෘති සසඳන්න. (ලකුණු 20)

08. i. කතිපයාධිකාරී වෙළෙඳපොල හඳුන්වන්න. (ලකුණු 08)

ii. "කතිපයාධිකාරී වෙළෙඳපොල තුළ පවතින්නේ නිර්මල තරඟයකි. "ඉහත ප්‍රකාශය හේතු දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

**********************